# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2375/37 – 2024 මාර්තු මස 15 වැනි සිකුරාදා – 2024.03.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2021/203.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.03.27 දිනැති හා අංක 2325/03 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.03.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහරගම, ඇල්හේන පාර, ජයසුන්දර පෙදෙස, අංක 10/12 ඒ ලිපිනයෙහි පිහිටි සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය (ඩී. එම්. ඩී. ගුණරත්න මයා වෙනුවෙන්) (නව ලිපිනය - කොච්චිකඩේ, උතුරු පල්ලන්සේන, දූවන පල්ලිය පාර, අංක 12/1) සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/34/2023 හා 2023.12.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,
කම්කරු කොමසාරිස් ජනරාල් (වැ.බ.)

2024 පෙබරවාරි මස 22 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 041598 – 13 (2024/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය

*නඩු අංකය:* ඒ/34/2023.
IR/COM/03/2021/203.

සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය,
(ඩී. එම්. ඩී. ගුණරත්න මයා වෙනුවෙන්)
අංක 10/21 ඒ,
ජයසුන්දර පෙදෙස,
ඇල්හේන පාර
මහරගම.
(නව ලිපිනය : සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය,
අංක 12/1, දූවන පල්ලිය පාර,
උතුරු පල්ලන්සේන, කොච්චිකඩේ.)
(ඩී. එම්. ඩී. ගුණරත්න මයා වෙනුවෙන්)

*පළමු පාර්ශ්වය.*

*එදිරිව*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*වග උත්තරකරු.*

අතර පවත්නා කාර්මික ආරාවුල

ඉහත පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය ප්‍රකාරව ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙකී ආරාවුල නිරාකරණය කිරීම සඳහා මා පත්කොට ඇත.

*යොමුව* :

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කරන ලද ඩී. එම්. ඩී. ගුණරත්න මයා 2016 වසරේ දී ස්වෙච්ඡාවෙන් විශ්‍රාම යාමට කරන ලද ඉල්ලීම වසර 1කුත් මාස 7ක් යනතුරු කටයුතු සිදුනොවීම මත එම අයදුම්පත ඉවත් කර ගැනීමට කර ඇති ඉල්ලීම පිළිනොගෙන 2018 වසරේ දී විශ්‍රාම ගැන්වීම මගින් ඒ මහතාට අසාධාරණයක් සිදුව තිබේ ද, යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.''

*ආරාවුලේ පසුබිම* :

ඉල්ලුම්කරුවන ඩී. එම්. ඩී. ගුණරත්න මහතා ස්වෙච්ඡාවෙන් විශ්‍රාම යාමට ඉල්ලා ඇත්තේ 2016 වසරේ දී ය. එකී ඉල්ලීම සම්බන්ධයෙන් පාලන අධිකාරිය වසර 1කුත් මාස 7ක් යනතුරු කටයුතු නොකිරීම මත ඉල්ලුම්කරු විශ්‍රාමික අයදුම්පත ඉවත්කර ගැනීමට තීන්දු කර ඇත. පසුව 2018 වසරේ දී වගඋත්තරකාර පාලන අධිකාරිය විසින් ඉල්ලුම්කරු විශ්‍රාම ගන්වා ඇත. ඉල්ලුම්කරු මෙම අධිකරණයෙන් අයැද සිටින්නේ ඔහුට හිමි හිඟ වැටුප් ද නැවත රැකියාව ස්ථාපිත කර ගැනීමට සහ අනිකුත් අධිකරණයට හැඟී යන සහන ලබාදෙන ලෙසත්ය.

*ප්‍රදානය* :

වර්ෂ 2023.11.14 වැනි දින පෙ.ව. 11.10ට ඉල්ලුම්කරු ද, ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිතවන මෝටර් සේවක සමිතියේ ප්‍රධාන ලේකම් කේ. බී. ප්‍රසාද් ප්‍රනාන්දු මහතා ද වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් වගඋත්තරකාර ආයතනයේ නියෝජිත පරිපාලන නිලධාරී එම්. ඩී. ඩී. ජී. අයි. රෝසස් මහත්මිය සමග නීතිඥ ඔෂිනි සේනාධිපති මෙනෙවිය පෙනී සිටි අතර දෙපාර්ශ්වයේ එකඟත්වය මත අධිකරණය විසින් සමථයක් සඳහා ඉඩදෙන ලදී.

ඉල්ලුම්කරු වෙත 2018.02.28 දින සිට පෙර සේවා කොන්දේසි මතම පඩිරහිතව පෙර සිටි සේවා ස්ථානයේම යළි රැකියාව ස්ථාපිත කිරීමට වගඋත්තරකාර ආයතනය එකඟවන අතර, එකී එකඟවීම සම්බන්ධයෙන් ඉල්ලුම්කරු ද තම අනුමැතිය ප්‍රකාශ කරයි. තවද නැවත සේවයට ස්ථාපිත කිරීමේ කටයුතු 2023.12.15 හෝ ඊට පෙර ඉටු කිරීමට දෙපාර්ශ්වය එකඟ වේ. තවද ඉල්ලුම්කරුගේ නියෝජිත මහතා කියා සිටින්නේ සේවය අත්හිටවූ කාලය සිට නැවත සේවය පිහිට වූ කාලසීමාව තුළ පාරිතෝෂික හිමිකම් හෝ කිසිදු දීමනාවක් ලබාගැනීමට ඉල්ලුම්කාර පාර්ශ්වය කටයුතු නොකරන බවයි. එසේම සේවය ප්‍රතිෂ්ඨාපනය කිරීම මත නැවතත් සේවය ඉවත්වන දින දක්වා පාරිතෝෂික හිමිකම් ලබාගත හැකි බවට දෙපාර්ශ්වය එකඟ වේ.

මේ අනුව මෙකී ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බවට ප්‍රකාශ කරමි.

බේරුම්කරු,
පාලිත සේනාධීර.

2023 දෙසැම්බර් මස 11 වැනි දින.

EOG 03 - 0129

---

මගේ අංකය: IR/COM/04/2021/112.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.11.21 දිනැති හා අංක 2307/07 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.11.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ඌව පැල්වත්ත, පස්සර පාර, බඹරගල නිවස ලිපිනයෙහි පදිංචි ඩබ්. එම්. විමලසේන මයා සහ 1. කොළඹ 04, මෙල්බන් ඇවනිව්, අංක 27, ප්‍රධාන කාර්යාලය ලිපිනයෙහි පිහිටි සී/ස ලංකා සීනි (පුද්.) සමාගම, 2. බුත්තල, පෞද්ගලික

තැපැල් මල්ල ලිපිනයෙහි පිහිටි සී/ස ලංකා සීනි කම්පැනි (පෞද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/79/2022 හා 2023.12.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල් *(වැ.බ.)*.

2024 මාර්තු මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

නඩු අංකය: A/79/2022.
ගොනු අංකය: IR/COM/04/2021/112.

ඩබ්. එම්. විමලසේන මයා,
බඹරගල නිවස,
පස්සර පාර,
ඌව - පැල්වත්ත

*පළමු පාර්ශ්වය*

සී/ස ලංකා සීනි (පුද්.) සමාගම,
ප්‍රධාන කාර්යාලය,
අංක 27, මෙල්බන් ඇවනිව්,
කොළඹ 04.

සී/ස ලංකා සීනි කම්පැනි (පෞද්ගලික) සමාගම,
පෞද්ගලික තැපැල් මල්ල,
බුත්තල.

*දෙවන පාර්ශ්වය*

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය ප්‍රකාරව තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් හෝකන්දර, අරංගල, රණමයුර මාවත, අංක 453 එෆ් හි පදිංචි කුමාරි ජයරත්න වන මා පත්කොට ඇත.

*බේරුම් කළයුතු කරුණු* :

කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ අංක IR/COM/04/2021/112 සහ 2022 නොවැම්බර් 03 දාතම සහිත යොමුවෙන් දක්වා ඇති පරිදි බේරුම් කළයුතු කරුණු වනුයේ සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගමේ සේවය කරන ඩබ්. එම්. විමලසේන මහතාට

1. 1998.08.02 දින P3 කාණ්ඩයේ පත්වීමක් ලබාදී P6 කම්කරු වැටුපකට ස්ථානගත කිරීම,
2. 1999.11.21 P4 කාණ්ඩයට පත්වීම් ලිපියක් ලබාදීම,
3. වසර 5කට වරක් සෙසු සේවකයන්ට ලබාදෙන උසස්වීම් ලබා නොදීම,
4. 1999 සිට P3 වැටුප් තලය හිමි ද හිමිනම් එය ලබා නොදීම,
5. 1999.12.01 දින සිට බැගෑස් කුඩු දීමනාව හිමි ද, හිමි නම් එය ලබා නොදීම.

යන කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.

(1) මෙහිදී විසඳිය යුතුව ඇති පළමු කරුණ සම්බන්ධව ගැටළුකාරී තත්ත්වයක් ඇත. එනම් 1998 දී පළමු පාර්ශ්වයට 1998 දී පත්වීමක් ලබා දී නොමැත. ඔහු 1993 සිට 1999 දක්වා අනියම් සේවකයකු ලෙස සේවය කර ඇත. අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් 1999.08.02 දින පැවැත්වීමෙන් අනතුරුව 1999.11.21 සිට P4 ශ්‍රේණියේ PAYLOADER OPERATOR කෙනෙකු ලෙස පත්වීමක් ලබා දී ඇත. මෙම තත්ත්වය දෙපාර්ශ්වයේ එකඟතාවය මත විසඳිය යුතු කාරණා 1999.11.21 ට පසුව බැව් සටහන් කරමි.

(2) විසඳිය යුතුව ඇති දෙපාර්ශ්වය පිළිගන්නා 1999.11.21 දිනැතිව ලබා දී ඇති PAYLOADER OPERATOR තනතුර P4 ශ්‍රේණියට පත්වීම ලබා දී ඇතත් පළමු පාර්ශ්වය කියා සිටිනුයේ එය P3 ලෙස විය යුතු බවත්, සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ P3 තනතුරක් සඳහා බවත්ය. දෙවන පාර්ශ්වය ද එම සම්මුඛ පරීක්ෂණය හා කැඳවීම් ලිපි සනාථ කර ඇත. සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත එසේ පිහිටු වූවාද යන්න පිළිබඳවත් ප්‍රමාණවත් සාක්ෂි නොමැත. කෙසේ වුවද පළමු පාර්ශ්වය කියා සිටිනුයේ තමාට P3 ශ්‍රේණියට අදාළව සුදුසුකම් සපුරා තිබූ බවත් P4 ශ්‍රේණියේ පත්වීම භාරගෙන දිගින් දිගටම ඒ පිළිබඳව ඉල්ලීම් කළ ද ප්‍රතිඵලයක් නොලැබූ බවයි. එසේ තමා ඉල්ලීම් කළ ලිපි පිටපත් ඉදිරිපත් කරමින් ඒ බැව් සනාථ කළ ද එම ලිපිවලට කිසිදු ප්‍රතිචාරයක් පාලන අධිකාරිය ලබාදුන් බවට සඳහනක් හෝ ඒ බැව් දැන සිටි බවක් හෝ දෙවන පාර්ශ්වය සඳහන් කොට නොමැත. ඒ පිළිබඳව නිගමනයකට එළැඹීමට එම නිසා ප්‍රමාණවත් කරුණු හෙළි නොවේ.

(3) 1999.11.21 P4 ශ්‍රේණියට පත්වීම් ලබා දී P6 වැටුප් තලයේ පිහිටුවා ඇති බවට පළමු පාර්ශ්වය කියා සිටී. නමුත් දෙවන පාර්ශ්වය ඉදිරිපත් කර ඇති වැටුප් තොරතුරු අනුව නියමිත වැටුප් තලයේ පිහිටුවා ඇති බැව් සනාථ වේ.

එමෙන්ම සෙසු සේවකයන්ට ලබාදෙන උසස්වීම් පැමිණිලිකරුට ලබානොදීම සම්බන්ධව ඉදිරිපත් වී ඇති තොරතුරු මත පිරික්සීමේ දී පහත පරිදි වැටුප් වර්ධක ලබාදීම, වැටුප් වැඩිවීම හා උසස්වීම් ලබාදීම සිදුවී ඇත.

| *දිනය* | *විස්තරය* | *වැටුප (රුපියල්)* |
|---|---|---|
| 1999.12.01 | ජේලෝඩර් යන්ත්‍ර ක්‍රියාකරු | 3685.00 |
| 2000.07.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයන්ට වැටුප් වැඩිවීම | 4085.00 |
| 2001.04.01 | රු. 5000/= ට අඩු වැටුප් ලබන සේවකයන්ට 10%කින් වැටුප් වැඩිවීම | 4494.00 |
| 2002.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 4565.00 |
| 2003.04.01 | වාර්ෂික වැටුප් වර්ධකය සහ රු. 500/= කින් වැටුප් වැඩිවීම | 5137.00 |
| 2003.10.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 5387.00 |
| 2003.11.01 | ශ්‍රේණි උසස්වීම් ලබාදීම 10% ක වැටුප් වැඩිවීම | 6107.00 |
| 2004.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 6190.00 |
| 2004.12.01 | මාසික වැටුප් ලබන සියළු සේවකයින්ට වැටුප් වැඩිවීම | 7190.00 |
| 2005.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 7308.00 |
| 2005.12.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 8058.00 |
| 2006.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 8141.00 |
| 2006.12.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 8891.00 |

| *දිනය* | *විස්තරය* | *වැටුප (රුපියල්)* |
|---|---|---|
| 2007.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 8974.00 |
| 2007.12.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 9774.00 |
| 2008.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 9857.00 |
| 2007.08.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 10,007.00 |
| 2008.06.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 11,757.00 |
| 2009.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 11,840.00 |
| 2009.06.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 13,490.00 |
| 2010.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 13,573.00 |
| 2010.06.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 15,073.00 |
| 2011.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 15,156.00 |
| 2011.06.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 17,256.00 |

විෂ මත්ද්‍රව්‍ය ළඟ තබාගෙන සිටිය දී පොලීසියට හසු වී බන්ධනාගාරගත වී ආයතනයේ කීර්තිනාමයට කැලලක් කිරීම හේතුවෙන් 2012.02.03 දින සිට 2014.02.13 දින දක්වා වැඩ තහනම් කිරීම හා 2012/2013 වර්ෂවලට අදාළ වැටුප් වර්ධකය අහිමි වී ඇත.

| *දිනය* | *විස්තරය* | *වැටුප (රුපියල්)* |
|---|---|---|
| 2012.06.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 19,256.00 |
| 2013.06.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 21,756.00 |
| 2014.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 21,839.00 |
| 2015.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 21,922.00 |
| 2016.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 22,005.00 |
| 2017.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 22,088.00 |
| 2017.07.16 | ශ්‍රේණි උසස්වීම් ලබාදීම 10% වැටුප් වැඩිවීම | 24,333.00 |
| 2018.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 24,441.00 |
| 2019.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 24,549.00 |
| 2020.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 24,657.00 |
| 2021.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 24,765.00 |
| 2022.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 24,873.00 |
| 2022.06.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට වැටුප් වැඩිවීම | 29,873.00 |
| 2023.01.01 | ශ්‍රේණි උසස්වීම් ලබාදීම 10% වැටුප් වැඩිවීම | 32,776.00 |
| 2023.01.01 | මාසික වැටුප් ලබන සියලු සේවකයින්ට මූලික වැටුප් වැඩිවීම | 37,776.00 |
| 2023.04.01 | වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම | 37,916.00 |

එසේ වුව ද පළමු පාර්ශ්වය විසින් 2012 වසරේ විෂ මත්ද්‍රව්‍ය ළඟ තබාගැනීමේ වරදට පොලීසියට හසුවී බන්ධනාගාර ගතවී ඇත. එහි දී කොළඹ මහාධිකරණය මගින් දඬුවම් නියම වී ඇත. එහි දී 2012.02.03 සිට 2014.02.13 දක්වා ආයතනයේ කීර්තිනාමයට කැළලක් සිදු කළා ය යන හේතුවෙන් සේවය අත්හිටුවා ඇත. සේවයෙන් පහකිරීමට තරම් ප්‍රමාණයේ වරදක් වුව ද, පළමු පාර්ශ්වයේ ඉල්ලීම මත සානුකම්පිතව නැවත සේවය ලබාදුන් බව දෙවන පාර්ශ්වය කියා සිටී. පළමු පාර්ශ්වය එම තත්ත්වය පිළිගනී. ලේඛන මගින් ඉහත තත්ත්වයක් සනාථ කරයි. එම නිසා 2012/2013 වර්ෂයන්හි වැටුප් වර්ධක පළමු පාර්ශ්වයට අහිමි වී ඇත.

(4) 1999 සිට P3 වැටුප් තලයේ හිමිකම සම්බන්ධව පැමිණිලිකරුගේ ස්ථාවරය වූයේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වූයේ P3 ශ්‍රේණියට බඳවා ගැනීමට බවත්, තමා සුදුසුකම් සපුරා ඇති බවත් නමුත් තමාට පත්වීම ලබාදුන්නේ P4 ශ්‍රේණියට බවත්ය. ලේඛන මගින් ඒ තත්ත්වය සනාථ වේ. නමුත් දෙවන පාර්ශ්වයේ ප්‍රති ලිඛිත දේශනයේ කරුණු දක්වමින් කියා ඇත්තේ ඉහත පළමු පාර්ශ්වයේ ප්‍රකාශය සත්‍ය වුව ද P3 ශ්‍රේණියේ තනතුරට සම්මුඛ පරීක්ෂණය කැඳවා ඇතත් ඔහුගේ පෙර සේවා තත්ත්වයන් හා සුදුසුකම් මත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය එවකට P4 ශ්‍රේණිය ලබාදීම සුදුසු බැව් තීරණය කොට ඇති බවත්, P4 ශ්‍රේණියට එවකට හිමි මූලික වැටුප වන රු. 3685/= හි පිහිටුවා තිබූ බවත්ය. එම තීරණය ගෙන ඇත්තේ 1999 වර්ෂයේ දී බැවින් වර්තමාන පාලනාධිකාරියට එවකට පැවති සම්මුඛ මණ්ඩල තීරණයක් හෝ ලබාදුන් පත්වීමක ශ්‍රේණි පිළිබඳව පිරික්සීම හෝ වෙනස් කිරීම කළ නොහැකි බවයි.

(5) බැගෑස් කුඩු දීමනාව සම්බන්ධව හිඟ ගණනයක් ඉදිරිපත් කරමින් පළමු පාර්ශ්වය කියා සිටිනුයේ තමාට එය 1999 සිට හිමි බවයි. බැගෑස් කුඩු සම්බන්ධව හා මෙම ක්ෂේත්‍රය හා කර්මාන්ත ශාලාව පිළිබඳව පුළුල් අධ්‍යයනයක් සඳහා දෙවන පාර්ශ්වය වෙතින් ඉල්ලීමක් කර කර්මාන්තශාලා ඉංජිනේරු කළමනාකරු කැඳවා ආයතනික ක්‍රියාදාමය මූලික අදියරේ සිට සටහන් කළෙමි. (2023.05.19 දින සාක්ෂි සටහන්) එහිදී උක්ගස් කැපීම, පැටවීම, ශුද්ධ කිරීම, සීනි නිෂ්පාදනය දක්වා ක්‍රියා පටිපාටිය සැකෙවින් දක්වමින්, පළමු පාර්ශ්වයේ සේවා භූමිකාව පිළිබඳව විමසා තොරතුරු ලබාගතිමි. එහිදී පළමු පාර්ශ්වය විසින් සිදුකරනුයේ උක්පැණි ගත් පසු ඉතිරිවන උක් කුඩු යන්ත්‍ර මගින් ඉවත්වීමේ දී ඒවා LOADER යන්ත්‍රයක් මගින් ඉවත්කර ගබඩා කිරීමෙන් ආයතනයේ විදුලි ජනනය සිදුකරන ස්ථානයට අවශ්‍ය විටෙක ගබඩා කර ඇති තැනින් ලබා දීමත් ය. මෙම උක් කුඩු බැගෑස් කුඩු යනුවෙන් හැඳින්වෙන බවත් ය. මෙම දීමනාව දැනට ආයතනයේ කිසිම සේවකයෙකුට ලබා නොදෙන බවත්, එවන් ආකාරයේ අවදානම් දීමනා ලෙස දැනට උක්ගස් ලොරි රථවල බාගන්නා ස්ථානවල සේවය කරන කම්කරුවන් සඳහා දූවිලි දීමනාවක් ලෙස දෛනික රු. 30 ක් ද බොයිලේරුවලින් ඉතිරි ගින්දර සහිත අළු ඉවත්කරන ස්ථානයේ සේවය කරන කම්කරුවන්ට HEAT ALLOWANCE ලෙස ද පමණක් ගෙවන බවයි. එමෙන්ම පළමු පාර්ශ්වය සේවය කරන ස්ථානයේ එක් වැඩමුරයකට 13 දෙනෙකු සේවය කරන බවත්, එම LOADER යන්ත්‍රයේ පළමු පාර්ශ්වය සිටින ස්ථානය ආවරණය කර ඇති, වායු සමීකරණ ක්‍රියාත්මක වන ස්ථානයක් බවයි. එම නිසා බැගෑස් කුඩුවලට නිරාවරණය වීමක් සිදුනොවන බවත් දෙවන පාර්ශ්වය කියා සිටී. කෙසේ වුව ද පළමු පාර්ශ්වයේ ඉල්ලීම මත එම ස්ථානය පිළිබඳ පිරික්සා අවදානම් දීමනාවක් ලබා දිය යුතු ද? යන්න තීරණය කිරීමට කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා පරීක්ෂණ අංශයට යොමු කිරීම සඳහා අවධානය යොමු කරමි.

ඉහත කී කරුණුවලට අමතරව පොදුවේ ගත්කළ මෙම සහන ඉල්ලා ඇති තත්ත්වයන් 1999 සිට බලපවත්වන හා එම මූලික අවස්ථාවේ සිදුවූවා යැයි පළමු පාර්ශ්වය කියා සිටින වැරදි ශ්‍රේණිගත කිරීම ප්‍රතිඵල මත උද්ගතව ඇති වැටුප/දීමනා/වැටුප් වර්ධක නොලැබීම් වේ. ඒ සම්බන්ධව පළමු පාර්ශ්වය විසින් තමා නිවැරදි ශ්‍රේණියක පිහිටුවූවා නම් යැයි උපකල්පනය කොට ඉදිරිපත් කර ඇති හිඟ ගණනයන් පැහැදිලි විස්තරාත්මක නොවන අතර එම සියලුම හිඟ ගෙවීම් පිළිබඳව තීරණයකට එළැඹීම වර්තමාන සේව්‍යත්වයට සාධාරණ හා යුක්ති සහගත නොවන බව නිරීක්ෂණය වේ.

මෙම අපැහැදිලි තත්ත්වය හේතුකොට ගෙන ඒ පළමු පාර්ශ්වය තමාට සිදු වූවා යැයි පුන පුනා කියනු ලබන අසාධාරණය සම්බන්ධව පැවති මූලික පරීක්ෂණ IR/COM/04/2021/112 (උප) ගොනු අධ්‍යයනය කළ අතර එහිදී දෙවන පාර්ශ්වය පෙර කල සිදුවූවා යැයි කියන පත්වීමේ ශ්‍රේණිගත කිරීම වර්තමාන කාලයට වෙනස්කිරීම කළ නොහැකි බැවින් ඒ සියල්ල වෙනුවෙන් රු. 2,500/- ගැලපීමක් වැටුපට එක් කිරීමට යෝජනා කර ඇත. නමුත් පළමු පාර්ශ්වය විසින් එය රු. 4,000/- ලෙසට ඉල්ලා සිට ඇත. එම නිසා එම අවස්ථාවේ සමථයකට එළැඹ නැත.

*ප්‍රදානය* :

1999 සිට ඇතිවූ බැච් කියන්නා වූ ශ්‍රේණිගත කිරීමේ වැරදි තත්ත්වය එදින පටන් නිවැරදි කිරීමට තරම් පැහැදිලි හා ප්‍රමාණවත් සාක්ෂි හෙළි නොවේ. මුල්කාලීනව සිදුවූ වැරදි හෝ සියලුම ගැටලු වර්තමානයේ මෙම ආයතනය රජයට පවරාගත් පසු නිවැරදි කිරීමට හෝ යාවත්කාලීන කිරීමට තීන්දු කිරීම ද සාධාරණ නොවේ. නමුත් මෙම පළමු පාර්ශ්වයට යම් අසාධාරණයක් සිදු වී ඇති බවට දෙවන පාර්ශ්වයට ද හැඟී යන බැවින් රු. 2,500/-ක දීමනාවක් ලබාදීමට කැමැත්ත ප්‍රකාශ වී තිබූ බැවිනුත්, පළමු පාර්ශ්වය එය රු. 4,000/-ක් ලෙසට වැඩිකර ඉල්ලා ඇති බැවිනුත් එම සමථ යෝජනා වී ඇති 2021 සිට, පැමිණිලිකරුගේ වැටුපට දීමනාවක් ලෙස රු. 3,000/- ක ප්‍රමාණයක් එකතු කිරීම සාධාරණ බව තීරණය කරමි.

2021 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා ලබාදිය යුතු ප්‍රමාණය : රු. 3000/- × 36 : රු. 108,000/-

ඉහත කී මුදල මෙම නියෝගය *ගැසට් පත්‍රයේ* පළ වීමෙන් පසු මසක කාලයක් තුළ මොණරාගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කිරීමට නියම කරමි.

(i) 2024 ජනවාරි සිට පළමු පාර්ශ්වය විශ්‍රාම යනතුරු මසකට රු. 3,000/- බැගින් වැටුපට දීමනාවක් ලෙස එකතු කිරීමටත්, එය සේවක අර්ථසාධක අරමුදල, සේවක භාරකාර අරමුදල ඇතුළු ව්‍යවස්ථාපිත හිමිකම් සඳහා වැටුපට එකතු කරගත යුතුවේ.

(ii) බැගෑස් කුඩු දීමනාව සම්බන්ධව තීරණයක් ලබාදීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක වෙත යොමු කිරීමට නියෝග කරමි. එසේ අවදානම් දීමනාවක් හෝ දූවිලි දීමනා හෝ එවැනි යම් දීමනාවක් සේවකයින්ට ලබාදීමට නම් ඒ පිළිබඳ විශේෂඥ දැනුම ඇති නිලධාරියෙකු පිරික්සා නිර්දේශ ලබාගත යුතුය. ඒ ලබන පරීක්ෂණ තීන්දුව මෙම හිඟ ගණනයන් ලබාදීමට අදාළ නොවිය යුතු ය.

ඉහත කී ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත බවට ප්‍රකාශ කර සිටිමි.

බේරුම්කරු,
කුමාරි ජයරත්න.

2023 දෙසැම්බර් මස 28 වැනි දින දී ය.

EOG 03 - 0130

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.